# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2007 අංක 09 දරන නැවත පදිංචි කරවීමේ අධිකාරිය පනත

---

[සහතිකය සටහන් කළේ **2007** මාර්තු මස **23** වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2007 මාර්තු මස 23 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
ගැසට් පත්‍රයේ **II** වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිළ :** රු.12.25 යි. තැපැල් ගාස්තුව **:** රු. 7.50 යි.

# 2007 අංක 09 දරන නැවත පදිංචි කරවීමේ අධිකාරිය පනත

[සහතිකය සටහන් කළේ 2007 මාර්තු මස 23 වන දින]

එල්.ඩී.—ඕ. 40/2006.

නැවත පදිංචි කරවීමේ අධිකාරිය යනුවෙන් හඳුන්වනු ලබන අධිකාරියක් පිහිටුවීම සඳහා ද රට අභ්‍යන්තරයේ අවතැන් වූ තැනැත්තන් සහ සරණාගතයන් නැවත පදිංචි කරවීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් සහ සැළසුමක් සකස් කිරීම ද, එකී තැනැත්තන් නැවත පදිංචි කිරීම, ක්‍රියාත්මක කිරීම, නියාමනය කිරීම සහ සමායෝජනය කිරීම ද, ඊට සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම ද සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය.

**1**. මේ පනත 2007 අංක 09 දරන නැවත පදිංචි කරවීමේ අධිකාරිය පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින්, අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන (මෙහි මින් මතු "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරන) දිනයක සිට ක්‍රියාත්මක වන්නේ ය.

## I වන කොටස

## නැවත පදිංචි කරවීමේ අධිකාරිය පිහිටුවීම

නැවත පදිංචි කරවීමේ අධිකාරිය පිහිටුවීම.

**2**. (1) නැවත පදිංචි කරවීමේ අධිකාරිය යනුවෙන් හඳුන්වනු ලබන (මෙහි මින් මතු "අධිකාරිය" යනුවෙන් සඳහන් කරනු ලබන) මණ්ඩලයක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) අධිකාරිය, (1) වන උපවගන්තියේ එයට දී ඇති නාමයෙන් අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ඇති සංස්ථාගත මණ්ඩලයක් විය යුතු අතර, ඒ නාමයෙන් අධිකාරිය විසින් නඩු පැවරීම ද, අධිකාරියට විරුද්ධව නඩු පවරනු ලැබීම ද කරනු ලැබිය හැකි ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය.

**3**. අධිකාරියේ කටයුතු කළමනාකරණය කිරීම පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත (මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) අධ්‍යක්ෂ මණ්ඩලයක් වෙත පැවරිය යුතු ය:—

(අ) නිලබලයෙන් පත් වූ සාමාජිකයන් දෙදෙනකු එනම්—

(i) මහා භාණ්ඩාගාරයේ ලේකම්වරයා හෝ ඔහුගේ නියෝජිතයකු; සහ

(ii) සැළසුම් ක්‍රියාත්මක කිරීමේ විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නියෝජිතයකු; සහ

(ආ) නැවත පදිංචි කරවීම, අලුතින් තැනක පදිංචි කරවීම, පුනරුත්ථාපනය කිරීම, යටිතල පහසුකම් සංවර්ධනය කිරීම, මූල්‍ය සහ පළාත් පරිපාලනය යන ක්ෂේත්‍රවල නිපුනතාවයක් දරන බවට ඔප්පු කර ඇති තැනැත්තන් අතරින් අමාත්‍යවරයා විසින් අධ්‍යක්ෂවරුන් ලෙස පත් කරනු ලබන (මෙහි මින් මතු "පත් කළ සාමාජිකයන්" යනුවෙන් සඳහන් කරනු ලබන) සාමාජිකයන් හත් දෙනකු.

අධිකාරියේ සභාපතිවරයා සහ උපසභාපතිවරයා.

**4**. (1) අමාත්‍යවරයා විසින් පත්කළ සාමාජිකයන් අතුරින් අධිකාරියේ සභාපතිවරයා සහ උපසභාපතිවරයා පත් කළ යුතු ය.

(2) සභාපතිවරයා සහ උපසභාපතිවරයා අවුරුදු තුනක කාලයක් සඳහා ධුර දැරිය යුතු අතර නැවත පත් කිරීම සඳහා යෝග්‍ය විය යුතු ය.

(3) සභාපතිවරයා අධිකාරියේ ප්‍රධාන විධායක නිලධරයා විය යුතු අතර ඔහු විසින් අධිකාරියේ සෑම රැස්වීමකම මුලසුන දැරිය යුතු ය. සභාපතිවරයා පැමිණ නොසිටි අවස්ථාවක දී, උපසභාපතිවරයා විසින් එවැනි යම් රැස්වීමක මුලසුන දැරිය යුතු ය.

(4) රෝගාතුරවීම, ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ වෙනත් හේතුවක් නිසා සභාපතිවරයාට ස්වකීය ධුරයේ කාර්ය ඉටු කිරීමට තාවකාලිකව නොහැකි වන අවස්ථාවක, සභාපතිවරයා වෙනුවෙන් උපසභාපතිවරයා කටයුතු කළ යුතු ය.

පත්කළ සාමාජිකයන්ගේ ධුර කාලය, ඔවුන් ඉවත් කරනු ලැබීම සහ ඉල්ලා අස්වීම.

**5**. (1) මණ්ඩලයේ පත්කළ සාමාජිකයකුගේ ධුර කාලය අවුරුදු තුනක් විය යුතු ය.

(2) පත්කළ සාමාජිකයකු විසින් අමාත්‍යවරයා අමතා යවනු ලබන ලිපියක් මගින් ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි අතර අමාත්‍යවරයා විසින් එය පිළිගනු ලබන දින සිට ඒ ඉල්ලා අස්වීම බලාත්මක විය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් හේතු දක්වා පත්කළ සාමාජිකයකු ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(4) ධුරයෙන් ඉවත් කරනු ලැබ ඇති පත්කළ සාමාජිකයකු, මණ්ඩලයේ සාමාජිකයකු ලෙස නැවත පත් කිරීම සඳහා හෝ වෙන යම් ආකාරයකින් අධිකාරියට සේවය කිරීම සඳහා හෝ සුදුසු නොවිය යුතු ය.

(5) මණ්ඩලයේ සාමාජිකයකු මියයාම, ඉල්ලා අස්වීම හෝ ධූරයෙන් ඉවත් කිරීම සිදුවූ අවස්ථාවක, 5 වන වගන්තියේ විධිවිධාන සැළකිල්ලට ගෙන ඔහුගේ ධූරයේ කටයුතු කිරීමට අමාත්‍යවරයා විසින් වෙනත් සාමාජිකයකු පත් කරනු ලැබිය යුතු ය.

සාමාජිකයකු ලෙස පත් කරනු ලැබීමට නුසුදුසුවීම.

6. යම් තැනැත්තකු —

(අ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු, පළාත් සභා මන්ත්‍රීවරයකු හෝ යම් පළාත් පාලන සභාවක සභිකයකු වන්නේ නම් ; හෝ

(ආ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක බලාත්මකව පවතින යම් නීතියක් යටතේ බුන්වත් භාවයට හෝ බංකොලොත් භාවයට පත්ව ඇති තැනැත්තකු ලෙස ප්‍රකාශයට පත් කරනු ලැබ බුන්වත් භාවයෙන් හෝ බංකොලොත් භාවයෙන් නිදහස් නොකරනු ලැබ ඇත්නම් ; හෝ

(ඇ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක අධිකරණයක් විසින් පනවන ලද බන්ධනාගාරගත කිරීමේ දණ්ඩන නියමයක් විඳිමින් සිටී නම් හෝ විඳ ඇත්නම් ; හෝ

(ඈ) කායික හෝ මානසික රෝගයකින් අශක්නුතාවයකට පත්ව ඇත්නම් ; හෝ

(ඉ) වෙනත් යම් ආකාරයකින් සාමාජිකයකුගේ කර්තව්‍යයන් ඉටුකිරීමට නොහැකි වේ නම්,

ඒ තැනැත්තා අධිකාරියේ සාමාජිකයකු ලෙසින් පත් කරනු ලැබීමට හෝ සාමාජිකයකු ලෙසින් දිගටම කටයුතු කරගෙන යාමට හෝ නුසුදුසු විය යුතු ය.

ගණපූරණය.

7. මණ්ඩලයේ යම් රැස්වීමක් සඳහා වූ ගණපූරණය සාමාජිකයන් පස් දෙනෙකු විය යුතු අතර මණ්ඩලය විසින් මණ්ඩලයේ රැස්වීම් හා ඒ රැස්වීම්වල කටයුතු කරගෙන යාම සම්බන්ධයෙන් වූ ක්‍රියාපටිපාටිය විධිමත් කරනු ලැබිය හැකි ය.

අධ්‍යක්ෂවරුන් අතරේ පවතින පුරප්පාඩු හේතුවෙන් මණ්ඩලයේ යම් ක්‍රියා ආදිය බල රහිත නොවිය යුතු බව.

8. මණ්ඩලයේ සාමාජිකයන්ගේ යම් පුරප්පාඩුවක් තිබීමේ හෝ යම් සාමාජිකයකු පත්කිරීමෙහි ලා යම් දෝෂයක් තිබීමේ හෝ හේතුව නිසාම පමණක් මණ්ඩලයේ යම් ක්‍රියාවක්, තීරණයක් හෝ කටයුත්තක් බලරහිත නොවිය යුතු ය.

සාමාජිකයන්ගේ පාරිශ්‍රමික.

9. මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලැබිය හැකි යම් ආකාරයකින් පාරිශ්‍රමිකයන්, අධිකාරියේ අරමුදලින් මණ්ඩලයේ සාමාජිකයන්ට ගෙවනු ලැබිය හැකි ය.

අධිකාරිය රජයේ පොදු ප්‍රතිපත්තියට අනුකූල විය යුතු බව.

**10.** අධිකාරිය, එහි බලතල ක්‍රියාත්මක කිරීමේ දී, එහි කර්තව්‍යයන් ඉටු කිරීමේ දී සහ කාර්යයන් සිදු කිරීමේ දී, රජයේ පොදු ප්‍රතිපත්තියට සහ ඒ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට අදාළව අමාත්‍යවරයා විසින් අධිකාරිය වෙත නිකුත් කරනු ලබන යම් සාමාන්‍ය හෝ විශේෂ නියෝගවලට අනුකූලව කටයුතු කළ යුතු ය.

අධිකාරියේ මුද්‍රාව.

**11.** (1) අධිකාරියේ මුද්‍රාව කලින් කලට මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි පරිදි යම් තැනැත්තකු භාරයේ තැබිය යුතු ය.

(2) අධිකාරියේ මුද්‍රාව මණ්ඩලය විසින් තීරණය කරනු ලබන යම් ආකාරයකට වෙනස් කරනු ලැබිය හැකි ය.

(3) සභාපතිවරයා සහ මණ්ඩලයේ තවත් එක් සාමාජිකයකු ඉදිරිපිට දී හැර සංස්ථාවේ මුද්‍රාව කවර වූ හෝ සාධන පත්‍රයකට හෝ ලේඛනයකට නොතැබිය යුතු අතර, ඒ දෙදෙනාම විසින් තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් ඒ සාධන පත්‍රයට හෝ ලේඛනයට අත්සන් තබනු ලැබිය යුතු ය:

එසේ වුව ද, යම් සාධන පත්‍රයකයට හෝ ලේඛනයකට අධිකාරියේ මුද්‍රාව තබන අවස්ථාවේ දී සභාපතිවරයාට පැමිණ සිටීමට නොහැකි වන අවස්ථාවක දී, තත්කාර්ය සඳහා සභාපතිවරයා විසින් ලියවිල්ලකින් බලය පවරන ලද මණ්ඩලයේ වෙනත් යම් සාමාජිකයකුහට, මේ උපවගන්තියේ ඉහතින් වූ විධිවිධානවලට අනුකූලව ඒ සාධන පත්‍රයට හෝ ලේඛනයට අත්සන් තැබීමට නිසි බලය තිබිය යුතු ය.

(4) අධිකාරියේ මුද්‍රාව තබන්නේ යම් සාධන පත්‍රයකට හෝ ලේඛනයකට ද, ඒ සාධන පත්‍ර හෝ ලේඛන පිළිබඳ මණ්ඩලය විසින් රෙජිස්ටරයක් පවත්වාගෙන යා යුතු ය.

ශාඛා කාර්යාල පිහිටුවීම.

**12.** මේ පනත මගින් අධිකාරියට පවරන ලද බලතල සහ කර්තව්‍යයන් කරගෙන යාමේ කාර්යය සඳහා අවශ්‍ය අවස්ථාවල දී හඳුනාගත් දිස්ත්‍රික්කවල අධිකාරිය විසින් ශාඛා කාර්යාල පිහිටුවා පවත්වාගෙන යා හැකි ය.

## II වන කොටස

### පරමාර්ථ, කර්තව්‍යයන් සහ බලතල

අධිකාරියේ පරමාර්ථ.

**13.** අධිකාරියේ පරමාර්ථ විය යුත්තේ —

(අ) රට අභ්‍යන්තරයේ අවතැන් වූ තැනැත්තන් සහ සරණාගතයන් ආරක්ෂිත සහ ගෞරවනීය ආකාරයෙන් නැවත පදිංචි කිරීම හෝ අලුතින් පදිංචි කරවීම තහවුරු කිරීම ;

(ආ) රට අභ්‍යන්තරයේ අවතැන් වූ තැනැත්තන් සහ සරණාගතයන් සංවර්ධන ක්‍රියාවලියට ඇතුළත් කර ගැනීමට පහසුකම් සැලැස්වීම මගින් ඔවුන් පුනරුත්ථාපනය කිරීමට සහ ඔවුන්ට සහාය ලබාදීම පිණිස එකී තැනැත්තන් නැවත පදිංචි කිරීම සහ අලුතින් පදිංචි කිරීම පහසු කරලීම.

**14.** අධිකාරියේ පරමාර්ථ ඉටුකරගෙන යාමේ කාර්යය සඳහා අධිකාරිය විසින් පහත දැක්වෙන කර්තව්‍යයන් ඉටු කළ යුතු ය :— අධිකාරියේ කර්තව්‍යයන්.

(අ) රට අභ්‍යන්තරයේ අවතැන් වූ තැනැත්තන් සහ සරණාගතයන් සඳහා, නැවත පදිංචි කිරීමේ අමාත්‍යාංශය විමසා නැවත පදිංචි කිරීමේ ප්‍රතිපත්තියක් සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම ;

(ආ) පුද්ගලයන්ගේ අවතැන්ගතභාවය නිමා කිරීම පිණිස රජය, පරිත්‍යාගකරුවන්, ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන, සිවිල් සමිති, නියෝජ්‍යායතන සහ අනෙකුත් සමාගම්වල පරිශ්‍රමයන් සහ අවශ්‍ය කරන බලපත්‍ර සහ සම්පත් දරන්නන්ගේ පරිශ්‍රමයන් සම්බන්ධීකරණය කිරීම ;

(ඇ) රට අභ්‍යන්තරයේ අවතැන් වූ තැනැත්තන් සහ සරණාගතයන් ආරක්ෂිත සහ ගෞරවනීය ආකාරයෙන් නැවත පදිංචි කරවීම සහ අලුතින් පදිංචි කරවීම සඳහා විශේෂිත වැඩසටහන් සහ යෝජනාක්‍රම සකස් කර ක්‍රියාත්මක කිරීම ;

(ඈ) රට අභ්‍යන්තරයේ අවතැන් වූ තැනැත්තන්ට සහ සරණාගතයන්ට ඔවුන්ගේ උප්පැන්න, මරණ සහ විවාහ සහතික, හැඳුනුම්පත්, දේපළ වලට අදාළ ඔප්පු ආදී අහිමි වූ ලේඛන සහ ඔවුන්ට යම් රාජ්‍ය දෙපාර්තමේන්තුවකින් අවශ්‍ය විය හැකි වෙනත් ලේඛන ලබා ගැනීමට සහාය වීම ;

(ඉ) යටිතල පහසුකම්, අධ්‍යාපන සහ සෞඛ්‍ය පහසුකම් සපයාදීමට සහාය වීම ;

(ඊ) නැවත පදිංචි කරවීම සඳහා සහ අලුතින් පදිංචි කරවීම සඳහා පහසුකම් සැලසීම පිණිස නිවාස යෝජනා ක්‍රම ඇතුළුව නැවත පදිංචි කරවීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ;

(උ) සැළසුම් කළ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා දේශීය සහ විදේශීය යන දෙයාකාරයෙන්ම වූ මූල්‍ය සම්පත් යෙදවීමට සහාය වීම ;

(ඌ) නිශ්චල සහ චංචල වත්කම්වල අයිතිය ද හිමිකම ද සම්බන්ධ ගැටලු විසඳීමේ දී පහසුකම් සැලසීම ;

(එ) රට අභ්‍යන්තරයේ අවතැන් වූ තැනැත්තන් සහ සත්කාරක ප්‍රජාවන් අතර වඩා හොඳ අවබෝධයක් ඇති කරවීම ;

(ඒ) රට අභ්‍යන්තරයේ අවතැන් වූ තැනැත්තන් බලගැන්වීම සඳහා සංස්කෘතික අයිතිවාසිකම් ඇතුළුව මූලික මිනිස් අයිතිවාසිකම් නැවත නගා සිටුවීමට පහසුකම් සැලැස්වීම ;

(ඔ) අවතැන් වූවන්ගේ අවශ්‍යතාවයන් පිළිබඳ නියෝජනයන් භාරගැනීම සහ ඒ අවශ්‍යතාවයන් පිළිබඳ සැලකිල්ලට ගෙන ඒවාට විසඳුම් සෙවීමට බලයලත් නියෝජ්‍යායතනවලට ඒවා ඉදිරිපත් කිරීම ;

(ඕ) පුද්ගල හෝ ප්‍රජා අවශ්‍යතාවයන්ට අනුකූලව යථා තත්වයට පත් කිරීමට සහ සංවර්ධනය කිරීමට අවශ්‍ය හවුල් ව්‍යාපාර ඇරඹීම හා පවත්වාගෙන යාම සඳහා අවතැන් වූවන් මෙහෙයවීම ;

(ක) අවතැන් වූ තැනැත්තන් සහ සරණාගතයන් අතර ජීවිකාවෘත්තිය පිළිබඳ කටයුතු වැඩිදියුණු කිරීම ;

(ග) ඔවුන් යථා තත්වයට ගෙන ඒම සඳහා හඳුනාගත් ප්‍රතිපත්ති, සම්පත් සහ කටයුතුවල ප්‍රගතිය පිළිබඳ තොරතුරු ලබා ගැනීමට සාධාරණ ප්‍රවේශයක් සැපයීම සහ මැදිහත් වන නියෝජ්‍යායතන සමග සංවාද පැවැත්වීම පහසුකරලීම; සහ

(ච) බිම් බෝම්බ සහ සුන්බුන් ඉවත් කිරීමෙන් සහ හානියට පත්වූ යටිතල පහසුකම් අලුත්වැඩියා කිරීමෙන්, නැවත පදිංචි කරවීම සඳහා සුදුසු භෞතික පරිසරයක් ලබා දෙන බවට සහතික වීම.

අධිකාරියේ බලතල.

**15**. අධිකාරිය විසින් එහි කර්තව්‍යයන් ඉටුකිරීමේ කාර්යය සඳහා පහත දැක්වෙන බලතල සියල්ල හෝ ඉන් කිසිවක් හෝ ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය :—

(අ) යම් චංචල හෝ නිශ්චල දේපළක් අත්කර ගැනීමට හා දැරීමට, බද්දට හෝ කුලියට දීමට හෝ ගැනීමට, උකස් කිරීමට, විකිණීමට හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමට ;

(ආ) රාජ්‍ය හෝ පෞද්ගලික තැනැත්තන්ගෙන් අත්කර ගත් ඉඩම් නිරවුල් කර ප්‍රතිසංවර්ධනය කිරීම ;

(ඇ) අධිකාරියේ කර්තව්‍යයන් ඉටුකිරීම සඳහා අධිකාරිය විසින් අවශ්‍ය යයි සලකනු ලබන පරිදි වූ සියලු ගිවිසුම්වලට ඇතුළත් වීම, ඒවා ක්‍රියාත්මක කිරීම ; සහ

(ඇ) මුදල් ආකාරයෙන් හෝ අන්‍යාකාරයෙන් ලැබෙන ත්‍යාග, ප්‍රදාන හෝ පරිත්‍යාග පිළිගැනීම සහ අධිකාරියේ කර්තව්‍යයන් ඉටු කිරීමේ දී ඒවා අදාළ කර ගැනීම ;

16. (1) අධිකාරියේ බලතල, කාර්ය සහ කර්තව්‍යයන් කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීමේ, ඉටුකිරීමේ සහ කිරීමේ කාර්යය සඳහා යම් රජයේ දෙපාර්තමේන්තු, පළාත් පාලන ආයතන, රාජ්‍ය සංස්ථා සහ හවුල් ව්‍යවසාය ඇතුළුව වෙනත් පොදු හෝ පෞද්ගලික ආයතන සමග යම් ගිවිසුමකට එළඹීමට අධිකාරියට බලය තිබිය යුතු ය.

යම් ගිවිසුමකට එළඹීම සඳහා අධිකාරියට ඇති බලතල.

(2) එවැනි සෑම ගිවිසුමක් ම ලිඛිතව තිබිය යුතු අතර, අධිකාරියේ ලියාපදිංචි කරනු ලැබීමේ දී අධිකාරිය සහ අවස්ථාවෝචිත පරිදි ඒ රජයේ දෙපාර්තමේන්තු, පළාත් පාලන ආයතන, රාජ්‍ය සංස්ථා සහ හවුල් ව්‍යවසාය ඇතුළුව වෙනත් පොදු හෝ පෞද්ගලික ආයතන සමග බැඳීම් ඇතිකරන්නා වූ ද වලංගු වූ ද ගිවිසුමක් වන්නේ ය.

17. ශ්‍රී ලංකාවෙන් පිටත යම් ස්ථානයක දී අධිකාරිය සඳහා හෝ අධිකාරිය වෙනුවෙන්, පොදුවේ හෝ යම් නිශ්චිත කාරණයක් වෙනුවෙන් කටයුතු කිරීමට, යම් තැනැත්තකුට මණ්ඩලය විසින් අධිකාරියේ මුද්‍රාව යටතේ ලියවිල්ලකින් හෝ අධිකාරිය විසින් සාදනු ලබන රීතිවල විධිවිධාන සලස්වා ඇති වෙනත් යම් ආකාරයකට හෝ බලය පවරනු ලැබිය හැකි ය.

ශ්‍රී ලංකාවෙන් පිටත දී අධිකාරිය වෙනුවෙන් කටයුතු කිරීම සඳහා තැනැත්තන්ට බලය දීම.

18. (1) අධිකාරියේ යම් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සඳහා නම් කළ ප්‍රදේශයක පිහිටි යම් ඉඩමක් හෝ යම් ඉඩමක යම් සම්බන්ධතාවක් අධිකාරියට අවශ්‍යව ඇත්තා වූ ද, යෝජිත අත්කර ගැනීම අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අනුමත කර ඇත්තා වූ ද අවස්ථාවක දී, ඒ ඉඩම හෝ ඉඩමක යම් සම්බන්ධතාව පොදු කාර්යයන් සඳහා අවශ්‍ය ඉඩමක් හෝ ඉඩමක සම්බන්ධතාවක් ලෙස සලකා ඒ අනුව, ඒ ඉඩම හෝ යම් ඉඩමක සම්බන්ධතාව (460 වන අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ අත්කර ගනු ලැබ, අධිකාරිය වෙත පවරා දෙනු ලැබිය හැකි ය:

ඉඩම් අනිවාර්යයෙන් අත්කර ගැනීම.

එසේ වුව ද, නම් කළ ප්‍රදේශයක් තුළ පිහිටි වතු යායක ඉඩමක් හෝ එකී ඉඩමෙහි සම්බන්ධතාවක් අධිකාරියට අවශ්‍යව ඇති අවස්ථාවක, ඒ ඉඩම හෝ ඒ ඉඩමේ ඒ සම්බන්ධතාව අත්කර ගැනීම සඳහා මේ වගන්තිය යටතේ නියමයක් පළ කිරීමට පෙර අමාත්‍යවරයා විසින් වැවිලි කර්මාන්ත විෂයය භාර අමාත්‍යවරයා විමසිය යුතු ය.

(2) අධිකාරියේ යම් කාර්යයක් සඳහා නම් කළ ප්‍රදේශයක පිහිටි යම් ඉඩමක් හෝ ඉඩමක යම් සම්බන්ධතාවක් ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ අත්කර ගැනීමට අවශ්‍යව ඇත්තා වූ ද, (1) වන උපවගන්තිය යටතේ වූ නියමය පළ කරනු ලැබූ දිනයේ සිට වූ අවුරුදු තුනක කාලය

ඇතුළත කවර හෝ විටක එකී ඉඩම හෝ එකී සම්බන්ධතාව අත්කර ගැනීමේ අදහස පිළිබඳව ප්‍රසිද්ධ දැන්වීමක් එකී පනතින් නියම කර ඇති පරිදි පළ කරනු ලැබ ඇත්තා වූ ද අවස්ථාවක දී, එකී ඉඩම් අත්කර ගැනීමේ පනතේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, ඒ ඉඩම හෝ ඒ සම්බන්ධතාව වෙනුවෙන් ගෙවිය යුතු වන්දි මුදල තීරණය කිරීමේ කාර්යය සඳහා පහත දැක්වෙන විධිවිධාන අදාළ විය යුතු ය:—

(අ) ඒ ඉඩම අත්කර ගන්නා අවස්ථාවේ දී ඒ ඉඩම පවත්නා තත්වය, එකී නියමය කරන ලද දිනයේ දී, ඒ ඉඩමේ පැවති තත්ත්වයම වේ නම්, එදිනට ඒ ඉඩමට ලබා ගත හැකිව තිබුණු වෙළෙඳ අගයට, නියම කරන ලද දිනයෙන් පසුව ඒ ඉඩමට සද්භාවයෙන් කරන ලද වැඩි දියුණු කිරීම් කිසිවක් වේ නම් ඒවා සඳහා යුක්ති සහගත මුදලක්, එකතු කිරීමෙන් ලැබෙන අගය, ඒ ඉඩමේ වෙළෙඳ අගය ලෙස සැලකිය යුතු ය ;

(ආ) එකී නියමය පළකරනු ලැබූ දිනයේ ඒ ඉඩමේ පැවති වෙළෙඳ අගය නිශ්චය කිරීමේ දී, පනත ප්‍රකාර අධිකාරිය විසින් කරනු ලැබ ඇති යම් සංවර්ධන වැඩ හෝ වෙනත් කටයුතු හේතු කොට ගෙන සෘජුව හෝ වක්‍රව උපචිත වූ යම් ප්‍රතිලාභයක් හෝ අගය වැඩිවීමක් සහ එසේ උපචිත විය හැකි යම් ප්‍රතිලාභයක් නැතහොත් අගය වැඩි වීමක් පිළිබඳ යම් බලාපොරොත්තුවක් සැලකිල්ලට නොගත යුතු ය.

රජයේ චංචල හා නිශ්චල දේපළ අධිකාරියට ලබා දිය යුතු බව.

**19**. (1) රජයේ යම් නිශ්චල දේපළක්, අධිකාරියේ යම් කාර්යයක් සඳහා අවශ්‍ය වන අවස්ථාවක, ඒ කාර්යය, ඒ දේපළ (454 වන අධිකාරිය වූ) රජයේ ඉඩම් ආඥාපනතේ 6 වන වගන්තිය යටතේ වූ විශේෂ ප්‍රදානයක් කළ හැකි හෝ බද්දක් දිය හැකි හෝ කාර්යයන් ලෙස සැලකිය යුතු අතර, ඒ අනුව අධිකාරිය වෙත ඒ දේපළ සම්බන්ධයෙන් කෙරෙන විශේෂ ප්‍රදානයකට හෝ බදු දීමකට හෝ ඒ ආඥාපනතේ විධිවිධාන අදාළ විය යුතු ය.

(2) රජයේ යම් චංචල දේපළක් අධිකාරියේ යම් කාර්යයක් සඳහා අවශ්‍ය වන අවස්ථාවක, අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින්, ඒ චංචල දේපළෙහි සන්තකය හා ප්‍රයෝජනය අධිකාරිය වෙත පවරා සතු කර දිය හැකි ය:

එසේ වුව ද, රජයේ යම් චංචල දේපළක් කෙරෙහි බලපාන කිසිම නියමයක් ඒ දේපළෙහි, පාලනය දරන අමාත්‍යවරයාගේ එකඟත්වය නොමැතිව, මේ උපවගන්තියේ ඉහතින් වූ විධිවිධාන යටතේ අමාත්‍යවරයා විසින් නොකළ යුතු ය.

## III වන කොටස

### මුදල්

**20**. (1) අධිකාරියට එහිම අරමුදලක් තිබිය යුතු ය. ඒ අරමුදලට පහත දැක්වෙන මුදල් බැර කරනු ලැබිය යුතු ය :— අධිකාරියේ අරමුදල.

(අ) අධිකාරියේ ප්‍රයෝජනය සඳහා පාර්ලිමේන්තුව විසින් කලින් කල සම්මත කර දෙනු ලබන සියලු මුදල් ;

(ආ) මේ පනත යටතේ අධිකාරියට දී ඇති සියලු බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, කිරීමේ දී සහ ඉටු කිරීමේ දී අධිකාරිය වෙත ලැබෙන සියලු මුදල් ;

(ඇ) ණය මුදල්, පරිත්‍යාග, ත්‍යාග හෝ ප්‍රදාන වශයෙන් ශ්‍රී ලංකාව තුළ දී හෝ ඉන් පිටත දී කවර හෝ ප්‍රභවයකින් අධිකාරියට ලැබෙන සියලු මුදල් ; එසේ වුව ද ඒ මුදල් සාමාන්‍ය අයවැය සැකසුමක් මගින් ගණනය කළ යුතු ය.

(2) ලිත් වර්ෂය අධිකාරියේ මුදල් වර්ෂය විය යුතු ය.

(3) අධිකාරියේ ආදායම් හා වියදම්, වත්කම් හා බැරකම් සහ වෙනත් සියලු මුදල් ගණුදෙනු සම්බන්ධයෙන්, අධිකාරිය විසින් නිසි ගිණුම් පොත් තබා ගැනීමට සැලැස්විය යුතු ය.

(4) රාජ්‍ය සංස්ථාවල ගිණුම් විගණනය කිරීමට අදාළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන, අධිකාරියේ ගිණුම් විගණනය සම්බන්ධයෙන් අදාළ වන්නේ ය.

### අධිකාරියේ කාර්ය මණ්ඩලය

**21**. (1) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන අධ්‍යක්ෂ ජනරාල්වරයකු සිටිය යුතු අතර, මණ්ඩලයේ සාමාන්‍ය හෝ විශේෂ විධිවිධානවලට සහ පාලනයට යටත්ව, අධිකාරියේ කටයුතු සහ ගණුදෙනු මෙහෙයවීම ද, අධිකාරියේ බලතල, කර්තව්‍ය සහ කාර්ය ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම සහ කිරීම ද, අධිකාරියේ නිලධරයන් හා සේවකයන් පිළිබඳ පරිපාලනය හා පාලනය ද අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත පැවරෙන්නේ ය. අධ්‍යක්ෂ ජනරාල්වරයා.

(2) මේ පනතේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත පවරනු ලැබූ හෝ පනවනු ලැබූ හෝ භාර කරනු ලැබූ බලතල, කර්තව්‍ය හෝ කාර්ය කිසිවක් යම් නිලධරයකුට හෝ සේවකයකුට පැවරීම අවශ්‍ය යයි අධ්‍යක්ෂ ජනරාල්වරයා සලකන යම් අවස්ථාවක දී අධිකාරියේ අනුමතය ඇතිව, ඔහු විසින් ඒ බලතල, කර්තව්‍ය හෝ කාර්ය එසේ පවරා දෙනු ලැබිය හැකි අතර, අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ සාමාන්‍ය හෝ විශේෂ විධානවලට යටත්ව ඒ නිලධරයා හෝ සේවකයා විසින් ඒ බලතල, කර්තව්‍ය හෝ කාර්ය ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම සහ කිරීම කළ යුතු ය.

අධිකාරියේ කාර්ය මණ්ඩලය.

**22**. (1) අධිකාරියේ කර්තව්‍ය කාර්යක්ෂම ලෙස ඉටු කිරීම සඳහා අවශ්‍ය යයි අධිකාරිය සලකන යම් නිලධරයන් හා සේවකයන් අධිකාරිය විසින් පත් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ පත් කරන ලද නිලධරයන්ට සහ සේවකයන්ට මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විමසා සහ අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව, අධිකාරිය විසින් නිශ්චය කරනු ලබන යම් ආකාරයකට හා එසේ තීරණය කරනු ලබන අනුප්‍රමාණ අනුව පාරිශ්‍රමික ගෙවනු ලැබිය යුතු අතර අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව අධිකාරිය විසින් නිශ්චය කරනු ලබන පරිදි වූ සේවා කොන්දේසිවලට ඔවුන් යටත් විය යුතු ය.

(3) රාජ්‍ය සේවයේ නියුක්ත යම් නිලධරයකු අධිකාරියේ ඉල්ලීම පිට ඒ නිලධරයාගේ ද, රාජ්‍ය පරිපාලන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ ද කැමැත්ත ඇතිව අධිකාරිය විසින් නිශ්චය කරනු ලබන යම් කාලයක් සඳහා අධිකාරියට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය ; නැතහොත් එවැනිම කැමැත්ත ඇතිව ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(4) රාජ්‍ය සේවයේ නියුතු යම් නිලධරයකු අධිකාරියේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලබන අවස්ථාවක දී, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ නිලධරයාට හා ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(5) රාජ්‍ය සේවයේ නියුතු යම් නිලධරයකු අධිකාරියේ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබූ අවස්ථාවක දී, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ නිලධරයාට හා ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(6) යම් නිශ්චිත කාලයක් රජයට සේවය කිරීමට ගිවිසගෙන සිටින යම් තැනැත්තකු අධිකාරිය විසින් සේවයේ යොදවනු ලබන අවස්ථාවක දී, ඒ තැනැත්තා විසින් අධිකාරියේ සේවය කරනු ලබන යම් කාලයක්, එකී ගිවිසුමේ බැඳීම් ඉටු කිරීමේ කාර්ය සඳහා රජයට සේවය කළ කාලයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(7) පළාත් පාලන සේවයේ යම් සාමාජිකයකු හෝ පළාත් පාලන ආයතනයක වෙනත් යම් නිලධරයකු හෝ නිලධරයන් කිහිප දෙනකු අධිකාරියේ ඉල්ලීම පිට ඒ සාමාජිකයාගේ, නිලධරයාගේ හෝ සේවකයාගේ කැමැත්ත ඇතිව සහ අවස්ථාවෝචිත පරිදි, පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ හෝ පළාත් පාලන ආයතනයේ කැමැත්ත

ඇතිව, අධිකාරියේ කාර්ය මණ්ඩලයට එවැනිම කැමැත්ත ඇතිව, අධිකාරිය විසින් නිශ්චය කරනු ලබන කාලයකට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය ; නැතහොත් විශ්‍රාම වැටුප් හෝ අර්ථ සාධක අරමුදල් පිළිබඳ අයිතිවාසිකම්වලට අදාළ නියම හා කොන්දේසි ඇතුළුව, අධිකාරිය සහ පළාත් පාලන සේවා කොමිෂන් සභාව හෝ එකී පළාත් පාලන ආයතනය එකඟ වන නියම හා කොන්දේසි මත අධිකාරියේ කාර්ය මණ්ඩලයට ස්ථිරවම පත් කරනු ලැබිය හැකි ය.

(8) පළාත් පාලන සේවයේ යම් සාමාජිකයකු හෝ යම් පළාත් පාලන ආයතනයක යම් නිලධරයකු හෝ සේවකයකු (7) වන උපවගන්තිය යටතේ අධිකාරියේ කාර්ය මණ්ඩලයට තාවකාලිව පත් කරනු ලැබූ අවස්ථාවක දී, මේ අධිකාරියේ කාර්ය මණ්ඩලයේ වෙනත් කවර වුව ද සාමාජිකයකු යටත් වන විනය පාලනයටම ඔහු යටත් විය යුතු ය.

අධිකාරියේ කාර්ය මණ්ඩලයට රාජ්‍ය සංස්ථාවක නිලධරයන් සහ සේවකයන් පත් කිරීම.

**23**. (1) රාජ්‍ය සංස්ථාවක යම් නිලධරයකු හෝ සේවකයකු අධිකාරියේ ඉල්ලීම පිට ඒ නිලධරයාගේ හෝ සේවකයාගේ කැමැත්ත ඇතිව සහ ඒ සංස්ථාවේ පාලක මණ්ඩලයේ කැමැත්ත ඇතිව, අධිකාරියේ කාර්ය මණ්ඩලයට, එවැනිම කැමැත්ත ඇතිව අධිකාරිය විසින් තීරණය කරනු ලබන කාලයකට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය ; නැතහොත් විශ්‍රාම වැටුප් හෝ අර්ථසාධක අරමුදල් පිළිබඳ අයිතිවාසිකම්වලට අදාළ නියම හා කොන්දේසි ඇතුළුව, අධිකාරිය සහ ඒ සංස්ථාවේ පාලක මණ්ඩලය එකඟ වූ නියම සහ කොන්දේසි මත, එවැනිම කැමැත්ත ඇතිව අධිකාරියේ කාර්ය මණ්ඩලයට ස්ථිරවම පත් කරනු ලැබිය හැකි ය.

(2) යම් තැනැත්තකු (1) වන උපවගන්තිය යටතේ තාවකාලික හෝ ස්ථිරවම අධිකාරියේ කාර්ය මණ්ඩලයට පත් කරනු ලබන අවස්ථාවක දී, ඒ කාර්ය මණ්ඩලයේ වෙනත් කවර වුව ද සාමාජිකයකු යටත් වන විනය පාලනයටම ඔහු ද යටත් විය යුතු ය.

(3) මේ වගන්තියේ කාර්ය සඳහා "පාලක මණ්ඩලය" යන යෙදුම යම් රාජ්‍ය සංස්ථාවක් සම්බන්ධයෙන් යෙදී ඇති විටක, ඒ රාජ්‍ය සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය හෝ ඒ රාජ්‍ය සංස්ථාවේ පරිපාලනය සහ කළමනාකරණය පවරා දී ඇති වෙනත් පුද්ගල මණ්ඩලයක් අදහස් වේ.

## සාමාන්‍ය

මණ්ඩලයේ බලතල පැවරීම.

**24**. අධිකාරිය විසින්, එයට පවරා ඇති හෝ භාරදී ඇති බලතල හෝ කර්තව්‍ය කිසිවක්, ක්‍රියාත්මක කිරීම හෝ ඉටු කිරීම අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයාට හෝ යම් නිලධරයකුට හෝ සේවකයකුට හෝ යම් රජයේ දෙපාර්තමේන්තුවක හෝ රාජ්‍ය සංස්ථාවක යම් නිලධරයකුට ඒ නිලධාරියාගේ කැමැත්ත ඇතිව ලිඛිතව පවරා දෙනු ලැබිය හැකි ය. එසේ පවරා දෙනු ලැබුව ද, ඒ බලතල, කාර්ය හෝ කර්තව්‍ය කිසිවක් අධිකාරිය විසින් ක්‍රියාත්මක කිරීම, කිරීම හෝ ඉටු කිරීම කළ හැකි ය.

අමාත්‍යවරයා විසින් අනුමත කර ඇත්නම් මිස අධිකාරියේ සාමාජිකයකු හට සම්බන්ධතා ඇති ව්‍යවසායක් සමග අධිකාරිය ව්‍යාපාරික කටයුතු නොකළ යුතු බව.

**25**. අධිකාරියේ සාමාජිකයකු, හවුල්කරුවකු, අධ්‍යක්ෂවරයකු හෝ කොටස්කරුවකු වන හෝ වෙනත් යම් ආකාරයකින් යම් ව්‍යවසායකට සෘජුව ම හෝ වක්‍රව සම්බන්ධතාවක් ඇත්තා වූ ව්‍යවසායන් සමග අධිකාරිය විසින් කිසිදු ආයෝජනයක් හෝ අන්‍යාකාරයකින් වූ ව්‍යාපාර කටයුත්තක් ඒ ව්‍යාපාරික කටයුතු සඳහා අමාත්‍යවරයා විසින් අනුමතය දී ඇත්තේ නම් මිස අධිකාරිය විසින් නොකළ යුතු ය.

අමාත්‍යවරයා විසින් නිකුත් කරනු ලබන විධාන.

**26**. (1) අධිකාරියේ කාර්ය කිරීම සහ බලතල ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් පොදු හෝ විශේෂ විධාන ලිඛිතව අධිකාරියට දෙනු ලැබිය හැකි ය. ඒ විධානවලට අනුකූලව ක්‍රියා කිරීම අධිකාරියේ කාර්යය විය යුතු ය.

(2) අධිකාරියේ දේපළ සහ ක්‍රියාකාරකම් පිළිබඳ වාර්තා, ගිණුම් සහ වෙනත් තොරතුරු අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන ආකෘති අනුව අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරන ලෙස අමාත්‍යවරයා විසින් කලින් කල අධිකාරියට ලිඛිතව විධාන කරනු ලැබිය හැකි අතර, එම විධානවලට අනුකූලව ක්‍රියා කිරීම අධිකාරියේ කාර්යය විය යුතු ය.

අධිකාරිය අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් වන බව.

**27**. අධිකාරිය, (**52** වන අධිකාරය වූ)අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ පනතේ විධිවිධාන ඒ අනුව තේරුම් ගත යුතු ය.

අධිකාරියේ සාමාජිකයන්, නිලධරයන් සහ සේවකයන් රජයේ සේවකයන් ලෙස සැලකිය යුතු බව.

**28**. අධිකාරියේ සියලු සාමාජිකයන්, නිලධරයන් සහ සේවකයන් (19 වන අධිකාරය වූ)දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

මේ පනත යටතේ හෝ අධිකාරියේ විධානය මත හෝ කරනු ලැබූ ක්‍රියා සම්බන්ධයෙන් ආරක්ෂාව සැලසීම.

**29**. (1) (අ) අධිකාරිය විසින් මේ පනත යටතේ සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි උද්දේශිත යම් නීත්‍යානුකූල ක්‍රියාවන් සම්බන්ධයෙන් අධිකාරියට විරුද්ධව ; හෝ

(ආ) මේ පනත යටතේ හෝ අධිකාරියේ විධානය මත සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි උද්දේශිත යම් නීත්‍යානුකූල ක්‍රියාවන් සම්බන්ධයෙන් අධිකාරියේ යම් සාමාජිකයකුට, නිලධරයකුට, සේවකයකුට හෝ අනුයෝජිතයකුට විරුද්ධව,

කිසිම සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුතු ය.

(2) යම් අධිකරණයක් ඉදිරියේ අධිකාරිය විසින් හෝ අධිකාරියට විරුද්ධව හෝ පවරනු ලැබූ යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී අධිකාරිය විසින් දරන ලද වියදමක් අධිකාරියේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු අතර, එවැනි යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී අධිකාරිය වෙත ගෙවනු ලැබූ හෝ අධිකාරිය විසින් අයකර ගනු ලැබූ යම් නඩු ගාස්තුවක් අධිකාරියේ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ (ආ) ඡේදයෙහි සඳහන් යම් තැනැත්තකු විසින් මේ පනත යටතේ හෝ අධිකාරියේ විධානය මත කරන ලද හෝ කරන ලදැයි උද්දේශිත යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඒ තැනැත්තාට විරුද්ධව යම් අධිකරණයක් ඉදිරියේ පවරනු ලැබූ යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී, ඒ ක්‍රියාව සද්භාවයෙන් කරන ලදැයි අධිකරණය විසින් තීරණය කරනු ලැබුවහොත් ඒ තැනැත්තා විසින් දරන ලද යම් වියදමක් ඒ නඩුවේ දී ඒ තැනැත්තා විසින් අයකර ගනු ලැබ නොමැති නම්, ඒ වියදම් අධිකාරියේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

**30** (1) නියම කළ යුතු යයි මේ පනතින් නියමිත කාරණා සම්බන්ධයෙන් හෝ නියෝග සෑදීමට බලය දී ඇති කාරණා සම්බන්ධයෙන් හෝ නියෝග, අමාත්‍යවරයා විසින්, අධිකාරිය විමසා සාදනු ලැබිය හැකි ය. නියෝග.

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළ කරනු ලැබූ දින සිට හෝ ඒ නියෝගයෙහි නිශ්චිතව සඳහන් කොට ඇති වෙනත් පසු දිනයක හෝ සිට එය ක්‍රියාත්මක විය යුතු අතර, ඒ නියෝග මෙයින් පැනවූවක් ලෙස වලංගුව බලාත්මක විය යුතු ය.

(3) සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබීමෙන් පසු හැකි පහසු ඉක්මණින් පාර්ලිමේන්තුවේ අනුමතය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු ය. පාර්ලිමේන්තුව විසින් එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක් ඒ අනනුමතයේ දින සිට පරිච්ඡින්න වූ ලෙස සලකනු ලැබිය යුතු වුව ද, ඒ නියෝගය යටතේ ඊට පෙර කරන ලද යම් දෙයකට හානියක් නොවිය යුතු ය.

(4) යම් නියෝගයක් පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයෙහි පළ කළ යුතු ය.

**31**. (1) අධිකාරිය විසින් — රීති.

(අ) රැස්වීම් කටයුතු විධිමත් කිරීම සඳහා ක්‍රියා පටිපාටිය සහ ඒ කටයුතු පවත්වාගෙන යාම සඳහා ද ; සහ

(ආ) අධිකාරියේ මුද්‍රාව භාරයෙහි තබා ගැනීම සහ මුද්‍රාව තැබිය යුතු ආකාරය පිළිබඳ විධිවිධාන සැලැස්වීම සඳහා ද,

රීති සාදනු ලැබිය හැකි ය.

(2) අධිකාරිය විසින් සාදනු ලබන සෑම රීතියක් ම ගැසට් පත්‍රයේ පළකරනු ලැබිය යුතු ය.

පනත අවුරුදු හයක කාලයක් සඳහා ක්‍රියාත්මක විය යුතු බව.

**32**. මේ පනතේ විධිවිධාන එය ක්‍රියාත්මක වන දින සිට අවුරුදු හයක කාලයක් සඳහා ක්‍රියාත්මකව තිබිය යුතු ය.

බදුගෙවීම් ආදියෙන් අධිකාරිය නිදහස් බව.

**33**. මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ නියමයන්ට අනුකූලව අනුමත කර ඇති යම් ප්‍රමාණයකට අධිකාරියේ ආදායම හෝ ලාභ වෙනුවෙන් ගෙවන යම් බද්දකින් අධිකාරිය නිදහස් විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**34**. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අර්ථ නිරූපණය.

**35**. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි —

"රට අභ්‍යන්තරයේ අවතැන් වූ තැනැත්තන්" යන්නෙන්, ව්‍යාප්ත වූ ප්‍රචණ්ඩකාරී තත්වයකදී හෝ සන්නද්ධ අරගලයක බලපෑම්වලින් හෝ බේරී සිටීම පිණිස හෝ විශේෂයෙන් එහි ප්‍රතිඵලයක් ලෙස හෝ ඔවුන්ගේ නිවාස හෝ සුපුරුදු වාසස්ථානවලින් පලායාමට බල කරනු ලැබ ඇති හෝ ඉවත්වීමට යටත් වී ඇති තැනැත්තන් අදහස් වේ;

"පළාත් පාලන ආයතනය" යන්නෙන්, යම් මහනගර සභාවක්, නගර සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් අදහස් වන අතර, එවැනි යම් ආයතනයක් හෝ සභාවක් විසින් ක්‍රියාත්මක කරනු ලබන බලතලවලට, කරනු ලබන කාර්යවලට සහ ඉටු කරනු ලබන කර්තව්‍යවලට අනුරූපී හෝ සමාන බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමට, කිරීමට සහ ඉටු කිරීමට යම් නීතියක් මගින් හෝ නීතියක් යටතේ ඇතිකොට පිහිටුවන ලැබූ යම් අධිකාරියක් ද ඊට ඇතුළත් වේ ;

"රාජ්‍ය සංස්ථාව" යන්නෙන්, 1982 අංක 17 දරන සමාගම් පනත හෝ ඒ වෙනුවට පනවනු ලැබිය හැකි වෙනත් යම් පනතක් හැර වෙනත් යම් ලිඛිත නීතියකින් හෝ ඒ යටතේ රජය විසින් ප්‍රදාන, ණය හෝ අන්‍යාකාරයකින් සම්පූර්ණයෙන් හෝ අර්ධවශයෙන් සපයන ලද අරමුදල් හෝ ප්‍රාග්ධනයෙන් පිහිටුවනු ලැබූ හෝ පිහිටුවන ලද යම් සංස්ථාවක්, මණ්ඩලයක් හෝ වෙනත් මණ්ඩලයක් අදහස් වේ.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.